# ස්වයං අධ්‍යනයට අත්වැලක්

ශ්‍රේණිය -:11

වාරය -:දෙවෙනි වාරය

නිපුණතා මට්ටම -:2.3 ප්‍රස්තාර කරණයේ විධික්‍රම අනුගමනය කරයි.

ක්‍රියාකාරකම -: 2.3.1 තුන් තිතේ ප්‍රභේද දක්වමු.




සැකසුම - : එස්.එම්.ඒ.කේ. සබරගමුව

වත්/පරණගම මධ්‍ය මහවිදුහල


මෙහෙයවීම-: නර්තනය අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

වත්තේගම

උපදෙස් -: මෙය ලිඛිත හා ප්‍රායෝගික පාඩමකි.වැඩිදුර
අධ්‍යයනය කිරීම සඳහා පාසලේ ගුරු ඇසුර ලබා
ගතයුතුය.

හැදින්වීම -:මේ වන විට අපි 6,7,10 යන ශ්‍රේණිවල දී තිත්
ප්‍රභේද පිළිබඳ ඉගෙන ගත්තෙමු.මෙම පාඩම
අධ්‍යයනය කිරීමෙන් අපි බලාපොරොත්තු වන්නේ
දේශීය තාල පද්ධතිය තුළ,තිත් රූප
තුනක් එකතු වීමෙන් සෑදී ඇති තුන් තිතේ ප්‍රචලිත
තිත් ප්‍රභේද දෙකක් පිළිබඳ අවබෝධය ලබා ගැනීම
සඳහාය.

# තාලය යන්න හඳුනා ගනිමු

තාලය යනු “ක්‍රියාවෙන් කාලය මැනීමයි” ක්‍රියාව යනු නර්තනය,ගායනය,වාදන වල නිතර වීමයි.මෙම ක්‍රියාවේ නිරත වීමේ දී තාල තැබීම ප්‍රභේද තුනක් යටතේ හැඳින්විය හැකිය. ඒවා නම්

1. තනි තිතේ ප්‍රභේද
2. දෙතිතේ ප්‍රභේද
3. තුන් තිතේ ප්‍රභේද ලෙස ය.

තනි තිතේ ප්‍රභේද 3 කි.ඒවා මෙසේ වර්ග කර දැක්විය හැකිය



දෙතිතේ ප්‍රභේද 3කි.ඒවා මෙසේ වර්ග කර දැක්විය හැකිය.

- දෙතිතේ ප්‍රභේද
  - සුළු මැදුම් දෙතිත
    - මාත්‍රා 2+3
  - සුළු මහ දෙතිත
    - මාත්‍රා 2+4
  - මැදුම් මහ දෙතිත
    - මාත්‍රා 3+4

මෙම තිත් ප්‍රභේදයන් දෙක මේවන විටත් අපි ඉගෙන ගෙන ඇත්තෙමු.

## තුන් තිතේ ප්‍රභේද හඳුනා ගනිමු

දේශීය තාල පද්ධතිය තුල තිත් රූප තුනක් එකතු වීමෙන් තුන් තිත සෑදී ඇත. අපි මෙම වසරේදී එසේ සෑදී ඇති තිත් ප්‍රභේද දෙකක් පිළිබඳ ඉගෙන ගනිමු. ඒවා නම්

- දෙසුළු මැදුම් තුන්තිත
- දෙසුළු මහ තුන්තිත ය.

දෙසුළු මැදුම් තුන් තිත සෑදීමේදී සුළු තනි තිතේ තිත් දෙකක් හා මැදුම් තනි තිතක් එක්වී තුන් තිත සැදෙයි.එය අපට මෙසේ ලියා දැක්විය හැකිය.

- ❖සුළු තනි තිත+ සුළු තනි තිත+මැදුම් තනි තිත (2+2+3)

දෙසුළු මහ තුන් තිත සැදීමේදී ද සුළු තති තිතේ තිත් දෙකක් හා මහ තනි තිතක් එක්වී තුන් තිත සැදෙයි.එය අපට මෙසේ ලියා දැක්විය හැකිය.

- ❖සුළු තනි තිත+ සුළු තනි තිත+මහ තනි තිත (2+2+4)

මෙසේ තිත් රූප තුනක් එක්වී සෑදී ඇති තිත් ප්‍රභේදයන් “තුන් තිත” ලෙසින් අපි ඉගෙන ගනිමු.එය මෙසේද වගුගත කොට දැක්විය හැකිය.



තුන් තිතේ තිත් ප්‍රභේද ප්‍රස්තාරකරණයේදී අපි භාවිත කරන සංකේතයන් දෙකකි.එනම්

1. තිත් (^)
2. තෙයි (/) යනුවෙනි.

මෙම සංකේතයන් දෙක තුන් තිතේ තිත් රූපයන් ප්‍රස්තාර කිරීමේදී තිත් තිත් තෙයි ලෙසින් භාවිතා කල යුතුය.

උදාහරණ-:

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ^ | | ^ | | / | | | | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | | යනුවෙන් |

දැක්විය හැකිය.එය මෙසේද සංකේතවත් කල හැකිය.

| | | |
|---|---|---|
| තිත් | තිත් | තෙයි |
| ^ | ^ | / |

අපි මේ පාඩමේදි ඉගෙන ගන්නා ලද දෙසුළු මැදුම් තුන්තිත හා දෙසූළු මහ තුන්තිත තාලයට අයත් බෙර පද දෙකක් ප්‍රස්තාර වන ආකාරය ඉගෙන ගනිමු.

දෙසුළු මැදුම් තුන්තිතට (මාත්‍රා 2 + 2 + 3) අයත් “දොමි තකු දොමි තකු දොං ජිං ගත් තත් ජිංතරිකිට” යන බෙර පදය අපි මෙසේ ප්‍රස්තාර කර දක්වමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 | ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 |
| දොමි තකු<br>⌣ ⌣ | දොමි තකු<br>⌣ ⌣ | දොං ජිං -<br>⌣ ⌣ | ගත් -<br>⌣ | තත් -<br>⌣ | ජිං තරි කිට<br>⌣ ⌣ ⌣ |

එමෙන්ම දෙසුළු මහ තුන් තිතට (2+2+4) අයත් “කුද ගත ගත දොං” යන බෙර පදය ද අප මෙසේ ප්‍රස්තාර කර දක්වමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 4 | ^<br>1 2 | ^<br>1 2 | /<br>1 2 3 4 |
| කු ද | ග ත | ග ත දොං _<br>⌣ | කු ද | ග ත | ග ත දොං -<br>⌣ |

ඉහතින් දක්වා ඇති ආකාරයට තුන් තිතේ තිත් රූප සෑදෙන ආකාරය මෙම පාඩම තුලින් අපට ඉගෙන ගත හැකිය.